




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## මැදියම් සීතල

කලුහු වැල් අතු ඉති අගින්
පුරා සඳ එබිකම් කරයි
සිඟිත්තන් කිරි හීන දකිනා
මේ රැයේ මැදියාමයයි
මුදා ඇස ගෙත්තමෙන්, බැලුවොත්
රැයම පෙම්වත් වී හැඩයි
සොඳුර සඳලුව සීතලයි

සරා සඳ, සඳ සිසිල විසුරා
සිනහ සී සැඟවී හිඳියි
නොහිම් අප ප්‍රේමයේ මිහිරස
හැඳින කහ මල් වැල සැලෙයි
ප්‍රථම ප්‍රේමෙන් මත්ව ඈ ලා පසුරු
තුරු බඳ කිති කවයි
මේ රැයේ මැදියාමයයි

රෑ බදුලු නිල් එළි මවා
රෑ අඳුර දල්වා රැය නිදයි
පබලු සේ ඕගන්දි සේදෙට
ඇට්ටේරියා මල් පිපෙයි
පිල්ලෑව මංගල සිරි මවයි
සොඳුර සඳලුව සීතලයි
සිඟිත්තන් කිරි හීන දකිනා
මේ රැයේ මැදි යාමයයි

### චිරන්තන ජයසේන

**'මිත්‍රවරුනි, විප්ලවය සිදුවූයේ නැත' කාව්‍ය සංග්‍රහය - 2014**

භාෂාවත් රිද්මයත් මැනවින් ප්‍රයෝජනයට ගන්නා නූතන කවියන් අතර චිරන්තගේ කවිද සුවිශේෂී ලක්ෂණ වලින් අනන්‍යය වේ. රැයේ මැදියම් යාමයක් ගැන අපූරු ශෘංගාරාත්මක හැඟුම් මවමින් ජීවිතයේ මැදියම් යාමයක දැල්වුණු, ශේෂවුණු ජීවිතාශාවන්, ලාලසාවන් ගැන ඔහු අතින් ලියැවුණු අපූරු කවියකි මේ. 'මැදියම් සීතල' නම් කවියේ තේමාවේ වාච්‍යාර්ථයෙන් නැගෙන රෑ මැදියම් සීතලට එහා ගිය, මැදිවියට එළැඹුණු මිනිසකුගේ උණුහුමක් පතන චිත්තාභ්‍යන්තරයක තැවරුණු සීතලක් ගැන නොවේද මේ කථකයා අපට කියන්නේ?

රාත්‍රියක සඳලුතලයක මොහොතකට තනිවන ස්වාමිපුරුෂයකුගේ ස්වරයෙන් කවිය ඇරඹේ. සඳලුතලය හෝ බැල්කනිය සීතලෙන් නැහැවී ඇත. කලුහු වැල් අතු ඉති අස්සෙන් සරා සඳ එබිකම් කරයි. ඒ ඉතාමත් පෙම්වත් දසුනකි. පරිසරය නිහඬය; නිශ්චලය. නමුත් එ'දසුන් දනවන්නේ ඉතාමත් රෝමෝද්ගමනීය හැඟුම් සමුදායකි. මේ රාත්‍රියේ තනිවන පුරුෂයාට පරිසරය ඔස්සේ ලැබෙන කුල්මත් සංවේදනාවන් ඔස්සේ හිතට තනිකමක් ද දැනේ. සිඟිත්තන් කිරි හීන දකින්නේ ද මේ රාත්‍රියේමය. එකම රාත්‍රියක එක විට සිදුවන වෙන් වෙන් දෑ ගැන ඔහු අපට කියයි. පරිසරයේ ශෘංගාරය මුසු රමණීය සුන්දරත්වයට අමතරව ඔහු තම බිරින්දෑ ගැන ද සඳහන් කරයි. ඇයත් ඔහු මෙන්ම තවම නිදි නැත. ඈ ගෙත්තමක් ගොතමින් ඒ වැඩෙහි නිරතවී ඇති බවක් කියැවේ. ඉතින් මේ ඔහු ඈට කියන්නේ කුමක්ද? ගෙත්තමෙන් ඇස් මුදා සඳලුවට ඇවිත් රෑ මැදියමේ සිරි ඔහුත් සමඟ විඳගන්න කියා නොවේද?

ඔහු ඇයට සඳලුවට එන්නට සාධාරණ හා ආකර්ෂණීය හේතු පාට නිර්මාණය කරයි. දරුවෝ නිදති; සඳ එබේ; රාත්‍රිය පෙම්වත්ය. තවත් මොන අඩු පාඩුද? ඉතින් නෑවිත් සිටිය යුතුද?

නමුදු දෙවැනි කවියටත් පිවිසි අපට වැටහෙන්නේ, ඔහුගේ ආයාචනාවට තවමත් ඇගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බවකි. ජීවිතයේ මැදියමටත් කිසියම් උණුහුමක් අවැසි බව ඈ වටහා නොගන්නේ මන්ද? ඒ ඔහුගේ හිතට ඇති ගැටළුවයි. සියලු බාහිර සාධක අවැසි අයුරින්ම නිර්මිත නම්, මැදියමේ හිරිගඩු නැගෙන සීතල වෙනුවට, රුධිර සංසරණය වේගවත් කරවන පුංචි උණුහුමක් විඳුම ජීවිත මැදියමට අකැපද?

මැදිවියේ උන්නද ඔහු උත්සාහය අත් නොහළයි. ඔහු තවත් තුරුම්පුවක් අදී. සරා සඳ සිසිල විසුරා සිනහ සී සැඟවෙන බවක් කියයි. ඉතින්, සඳත් සැඟවේ නම්, ඔවුනොවුන් දෙස ඔත්තු බලන්නට වෙන කවුරුත් අසලක වත් නැත. ලජ්ජාශීලීව ඒ මොහොත නිකරුණේ අත්හැරිය යුතු නැත. ඒ රැයේ මිහිරිම වෙලාව නොවේද? කහ මල් වැල සැලෙන්නට ගනී. ඒ ඔවුන්ගේ ප්‍රේමයේ විතර වටහා ගෙන යැයි ඔහු කියයි. ඔහුගේ පරිසරයට ඇති දැඩි ආසක්ත බව ඔස්සේ අපට මැවී යන්නේ හොඳම අයුරින් සැකසී අති වටාපිටාවකි. මල් වැලත් ප්‍රේමයෙන් මත්ව තුරු බඳ කිති කවන්නට ගනී. නමුත්, බැල්කනියේ තනිව සීතල උහුලන ඔහුගේ බඳ වටේ එතෙන්නට තවමත් ඈ පැමිණ නොමැත. ඈ තවමත් ගෙත්තමේ සිරවී ඇති සැටියකි. ඒ රාත්‍රියේ මැදියම මෙන්ම, ජීවිතයේත් සීතලම මැදියම බව ඔහු අපට නොකියා කියන්නේ ඉසියුම්ම දුකක් පිටතට පෙනී නොපෙනෙන්නටය.

ඔහු එතෙකින් නතර නොවේ. එළිය විහිදුවන රෑ බදුල්ලන්ගේ නිල් අලෝක පුංජ ගැන කියන්නට ගනී. රාත්‍රිය නින්දට ගොස්ය. නමුදු ඒ සම්භෝගයකට ඇවැසිම මද ආලෝකය රෑ බදුල්ලන් කෙරෙන් තනා දීමෙන් පසුවය. මේ පාරිසරික සංකේතයන් ඉතාමත් අනුරාගීය. ඔහු ඈ පොළඹවන්නේ ඒ ඔස්සේය. සඳලුතලයේ හිඳ ඔහු ඒ දේ කියන සංයමය තුළ ඒ ගෙවෙන්නේ අත්දැකීම් ඔස්සේ පරිපූර්ණ වූ ජීවිතයේ මැදියම ම බව නැවත නැවතත් තහවුරු වේ. ඒ පරිණතභාවය, සංයමය නොවුණා නම් සඳලුතලයට වී ඔහු නොසිටිනු ඇත; සොබා සිරිය නොවිඳිනු ඇත. කාමරය ඇතුළේම ඈ අත වූ ගෙත්තම එහෙ මෙහේ වී නිදිගත් දරුවන් අතරමැද්දේම කලහ කලබල කෙඳිරිලි ස්වර ඔස්සේ ඇඳ ඇතිරිලි විගසින් පොඩිවී, එහෙ මෙහේ විසිවී යනු ඇත.

ඈ තවමත් ඇගේ ඕගන්දි සේදයේ වැඩ නිමවා නැත. ඈට මේ පරිසර විඳුම් දැක බලා ගැනීමට ඉස්පාසුවක් නැති සේය. ඇට්ටේරියා මල් පිපෙන්නේද ඇගේ සේදයට පබලු මෙනි. එහෙම කිව්වත් ඈ එය නතර කොට ඒවිද? දිවා කල මුළුල්ලේ දුවා-දරුවන්ගේ වැඩ මත්තේ නැඟී සිටින ඈට, රාත්‍රියේද, මේ මැදියමේද ඉස්පාසුවක් නැත. පිල්ලෑව මංගල සිරියෙන් දිස් වුණද ඇයට මධුසමයක වන් සුවයක් විඳින්නට ගොඩ ගැසී ඇති රාජකාරීන් බාධා කරන සේය.

අපගේ කතකයා ගේ ඉවසිල්ල තාමත් බිඳී නැත. දරුවන් කිරි හීන දකිමින් සිටින බව ඔහු නැවතත් මතක් කරයි. ඒ ඉතාමත් තැන්පත්, හික්මුණු ජීවිත මැදියමක තතු කියා පාමිනි. කලබලයෙන් මල් සුවඳ විඳින්නට බලකරන තාරුණ්‍යයක් නොවේ ඒ. ඕගන්දි සේදයේ වැඩ අතර මැදින් නවතා ඇට්ටේරියා මල් සුවඳ ඔස්සේ සඳළුතලයට ඇවිද ආ මැදිවියේ දෑතක් තුරු බඳ එතුණු ලිය මඩුල්ලක් සේ ඔහු වටා එතී ගොස් රාත්‍රියේත්, ජීවිතයේත් මැදියමක සීතල මකා දැමුවාදැයි අපි නොදනිමු. කුමකින් කුමක් අනතුරුව සිදුවුණි දැයි රිසි රිසි අයුරින් අපට සිතාගන්නට ඉඩ දී කවියා පසෙකට වෙයි.

